**Sannasa**
244 Princes Hwy
Hallam Vic 3803 Australia

**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
7, Stuart Place
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## මැතිවරණ

බලය රැකගැනීම පිළිබඳ ප්‍රශ්නයට ආණ්ඩුව මුහුණ පා ඇත්තේ කොතරම් බරපතල ලෙසද යන්න මේ දිනවල ඔවුන් ක්‍රියාවට නංවන සැලසුම් විසින්ම පැහැදිලිව පෙන්වනු ලැබ තිබේ. ඡන්දය හා බලය ගැන කතා කරන තරමටම බලය කුමක් සඳහාද යන්න ගැන කතා කරන්නේම නැති තරම්ය. පැහැදිලිව ඊට හේතුව එක් එක් නායකයා කුමන කතා කිව්වත් බලයට පත්වූ පසු කරන්නේ කියූ දේ නොවන වග කවුරුත් වාගේ දන්නා නිසා විය හැකිය.

දේශ ප්‍රේමය හා ජාතිවාදය යනු පසුගිය මැතිවරණ වලදී සාර්ථක ලෙස අලෙවි කළ හැකි මාතෘකාවක් වූ නමුදු මෙවර මැතිවරණයේ එහි ඉල්ලුම ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව පාලකයන් අවබෝධ කරගෙන ඇතිසේ ය. ජාතිය වෙනුවෙන් ආගම ඉදිරියට ගන්නේ ඒ අනුවය.

දේශප්‍රේමයට සේම දේශභක්තියට කළ හැකි දේ බොහෝ වග පාලකයෝ හොඳින් දනිති. පසුගියදා ඉන්දියාවෙන් වැඩමවාගෙන ආ කපිල වස්තු සර්වඥ ධාතූන් වහන්සේලා මැතිවරණ පැවැත්වෙන ප්‍රදේශවල ජනතාවට වැඳ පුදා ගන්නට සලස්වන්නේ ඒ අනුවය. ඒ හරහා ජනතාවගේ මනසට සංනිවේදනය කරන්න උත්සහ දරන්නේ බුද්ධාලම්බන ප්‍රීතියද? සටකපට කමින් හා බලය අනිසි ලෙස යොදා ගැනීමට හැකි ක්‍රම හා විධි මගින් කෙසේ හෝ බලයට පත් වීමට දේශපාලනයින් උත්සාහ කරන්නේ නම් ඒ කුමන අරමුණකින්ද ?

ඇත්ත වශයෙන්ම අපේ දේශපාලන ක්‍රමය සකස් වී ඇත්තේ බලයට පත්වන්නට රටේ පාලනයට අමතරව අසීමිත ලෙස ධනය උපයා ගැනීමට අයිතියද ලැබෙන පරිදිය. දේශපාලන බලය සඳහා කෙරෙන මැතිවරණයෙන් අවලාද අපහාස මඩ ගැසීමේ සිට ගහ මරා ගැනීම් දක්වා පත්වී ඇත්තේ ඒ නිසා ය.

බලයේ සිටින්නන් බලය අත්හැරීම අකැමතිවා සේම අනෙක් පාර්ශවය කෙසේ හෝ බලය ලබා ගැනීමට උත්සහ දරන්නේ එහි රසය ගැන දන්නා නිසා ය. මෙහිදී වඩාත්ම හාස්‍ය ජනක කරුණ වන්නේ මැතිවරණයකදී නිසි බලධාරියා බවට පත්වන මැතිවරණ කොමසාරිස්වරයා මුහුණ පානා ඉරණමයි. මැතිවරණ කොම්සම හරහා ඔහුට කෙතරම් බලය ලැබී තිබුණද පාලනයින් ඔහුගේ නියෝග ක්‍රියාත්මක නොකරයි නම් ඔහුට කළ හැක්කේ කුමක්ද ? පසුගිය මැතිවරණ ඉතිහාසය පුරාම අප අද්දුටුවේ එයයි. අවාසනාවකට මෙන් හෘද සාක්ෂියට එකඟව රාජකාරී කිරීමට නොහැකි වූ විට ඉල්ලා අස්වන සම්ප්‍රදායක් අපේ රටේ නොමැති හෙයින් ජනතාවට සිදු වී ඇත්තේ පාලකයින්ට අවශ්‍ය අයුරින් සිදුවන මැතිවරණ දෙස දෑස් අයා බලා සිටීමටයි.

සංස්කාරක



# අපට කිසිවක් අමතකව නැත

## නූතන උසස් අධ්‍යාපනයේ බහින කලාව

ජනරංග විජයිඳු දේවසුරේන්ද්‍ර

අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ අර්බුදයක් ඇත. ඒ බහුතරයක් වූ මහජනතාවට පමණි. මහජන ඡන්දයෙන් තේරී පත්වූ හෝ නිල බලය මත පත්වූ නිලධාරීන්ට එවැන්නක් නොමැති. මෙසේ එකම රටක් තුල එකම ගැටළුවක් දෙයාකාරයකට සංවේදීතාවක් දැක්වීම විමතියකට කරුණක් වුවත් ශ්‍රී ලංකාවේ බොහොමයක් ප්‍රශ්න එවැනි ලක්ෂණ විද්‍යමාන කරන බැවින් එය පුදුමයට කරුණක් නොව හුදෙක් විස්සෝපවීමට එක් අංශුමාත්‍රික හේතුවක් පමණක් බව සඳහන් කල යුතුය. සාමාන්‍යයෙන් ලෝකයේ ඕනෑම රජයකට හෝ පාලන තන්ත්‍රයකට ගැටළු පවතී. එම ගැටළු බොහොමයක් තත්කාලීන සිදුවීම් අරභයා ගොඩනැගෙන ඒවාය. නමුත් ශ්‍රී ලංකාවේ පාලන තන්ත්‍රය අභිමුව ඇති ගැටළු වලින් අති බහුතරයක් පාලන තන්ත්‍රය විසින්ම නිර්මාණය කරගත් ඒවාය. සරලව කියතොත් ලව්හින් දා ගත් ලෙඩල ගණයට වැටෙන ඒවාය. ඒ අතර අධ්‍යාපන ගැටළුවත් ප්‍රමුඛ ස්ථානයක් ගනී.

ලෝකයේ ඕනෑම රටක අනාගතය පිළිබඳ උදාන වාක්‍ය කීමේ දී පොදු ප්‍රකාශය නම් ඞඅධ්‍යාප නයෙන් තොර හෙටක් නැතඞ යන්න විය යුතුය. අධ්‍යාපනය මගින් නූතන පරපුර මෙන්ම අනාගත පරපුරද දැනුම, කුසලතා සහ ආකල්ප වලින් සන්නද්ධ කරන බව නොරහසකි. එහෙව් අධ්‍යාපනය ගරා වැටී නෂ්ටාවශේෂ බවට පත්වීමේ පෙරමග ලකුණු පෙන්වන රාජ්‍යයක් යම්දෙසක වේද එහි අනාගතය පිළිබඳ තතු දන්නෝ කියන්නේ ඒ රට යන්නේ අභාග්‍යසම්පන්න ගමනකට බවයි. වර්තමානයේ ශ්‍රී ලංකාව අධ්‍යාපනයේ හිනිපෙත්තට යනවා වෙනුවට වලපල්ලට යන ගමනේ බොහෝ දුරක් පැමිණ ඇත. මෙම ගමනේ පෙරමග ලකුණු පෙන්වීම ආරම්භවන්නේ මෙම රජය දෙවනි පියවරට පත්වීමත් සමගමය.

මීට දශක ගණනාවකට පෙරද ලංකා අධ්‍යාපනයේ මළගම වෙනුවෙන් පෙරමග සලකුණු පෙනෙන විට සමස්ත ජනතාව සහ ශිෂ්‍යයා සහ දේශ හිතෙශී සංවිධාන පොදු සමාජ ව්‍යාපාරයක් ලෙස එක්ව එයට එරෙහිව නැගී සිටිමින් නැවතත් අධ්‍යාපනය නිසි තැන තබන්නට කටයුතු සිදුකලහ. විශේෂයෙන්ම නිදහස් අධ්‍යාපනය රැකගැනීමෙහි ලා සරසවි ශිෂ්‍ය ප්‍රජාව, මහජනතාව සහ සමාජ ව්‍යාපාර යන ත්‍රිත්වය සුවිසල් කාර්යභාරයක් සිදුකරමින් රැකිය යුතු තැන්වල එය රැකගත්හ. නමුත් මෙවර අධ්‍යාපනය මළගමට යන්නේ හොරපාරකින් ය. ප්‍රධාන මාර්ගයේ පෙරකී අධ්‍යාපනයේ රැකුම්දූත පාර්ශව ත්‍රිත්වය අසරණ කර ඇත. ඒ කෙසේද යන්න මෙසේ පැවසිය හැක.

සරසවි ශිෂ්‍ය ප්‍රජාව මර්ධනයට දශක ගණනාවක සිටම රජයන් කටයුතු කරන්නේ නොකියයුතු දෑ කියා ජනතාව කුලප්පු කරවන පාර්ශවයක් යන හංවඩු ගැසීමෙනි. නමුත් මෙවර ශිෂ්‍ය මර්ධනය

4 වන පිටට